දඹුල්ල මහා නගර සභාව
මාතලේ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 10 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාව වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දඹුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.611,562 ක් වටිනා ස්ථාවර වත්කම් හා සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීමක වටිනාකම වූ රු.738,928 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් හා ඉදිකිරීම්වල වටිනාකම ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගනිමි. 2019 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ට්‍රැක්ටර් ට්‍රේලර් 04 ක වටිනාකම තක්සේරු කොට ගිණුම්ගත කර නොතිබුණි. | ට්‍රැක්ටර් ට්‍රේලර් තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වේ. | ලේඛනගත සාක්ෂි නොතිබීම නිසා ගිණුම්ගත කර නොමැත. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට ආයුර්වේද තොග ගබඩා ශේෂය රු.353,190 ක් නාගරික සංවර්ධන අධිකාරි හා එක්ව පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය රු.32,775 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | අඩුවෙන් ගිණුම්ගත කරන ලද ශේෂ නිවැරදි කළ යුතු වේ. | මිලදීගත් ඖෂධ වර්ෂයේ වියදමක් ලෙස සඳහන් කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතුව තිබූ ශේෂ 05 ක එකතුව වූ රු.82,965 ක් හා දිගම්පතහ කවශිමා ව්‍යාපෘතියේ බෝක්කුව සහ අතුපාරයාය | ණයහිමි ශේෂය නිවැරදි කර ගිණුම් නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | සමෘද්ධි මාවතේ පටුමඟ සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ණයගැති ශේෂවල එකතු වටිනාකම වූ රු.318,227 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. | | |
| (v) | ස්ථාවර වත්කම්වල එකතුව හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර රු.317,522,866 ක වෙනසක් තිබුණි. | වෙනසට හේතු හඳුනාගෙන ශේෂ නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | කැබ්රථයක් අලුත්වැඩියාව වෙනුවෙන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබූ රු.897,838 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් ලෙස දක්වා තිබුණි. | ණයහිමි ශේෂ නිවැරදි කර ගිණුම් නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.10,141,234 ක් වූ ගිණුම් විෂයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.1,232,222 ක අසමානතාවයන් විය. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. | පොදු තැන්පත් ගිණුමේ ශේෂය ලේඛන අනුව හඳුනාගත නොහැකි බවත් වර්ෂය තුළ මිලදීගත් ඖෂධ වර්ෂය තුළ ප්‍රයෝජනයට ගන්නා පදනම මත ගිණුම් පිළියෙල කර ඇත.<br><br>මුද්දර අග්‍රිම ගිණුමේ ශේෂයන් ආරම්භයේ සිට නිවැරදි කළ යුතු බව දන්වමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ලැබිය යුතු ගිණුම් | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වර්ෂයකට වැඩි හිඟහිටි කඩකුලී රු.7,514,517 ක් තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කඩ කාමර නව බදුකරුවන් වෙත 2019 වර්ෂයේදී ලබාදී ඇත. |
| (ii) | හිඟහිටි වරිපනම් රු.4,024,423 ක් අයකර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සුදුසු පරිදි හිඟ ශේෂයන් අයකර ගැනීමට හා අනෙකුත් ශේෂ කපාහැරීමට කටයුතු කරමි. |

ගෙවිය යුතු ගිණුම්

--------------------

| | | |
|---|---|---|
| දඹුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු රු.2,486,916 ක මුදලක් හා කර්මාන්ත ණයහිමියන්ට ගෙවිය යුතු රු.9,037,631 ක මුදලක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු වේ. | දක්වා ඇති ශේෂය නිවැරදි බව පිළිගන්නා බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.195,527,245 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | උපලේඛන ඉදිරිපත් කිරීමට හැකිතාක් ඉදිරියට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

-------------------

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2011 පෙබරවාරි 04 දිනැති අංක 13/2008(iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නාගරික කොමසාරිස්ගේ නිල වාහනය සඳහා අනුමැතියකින් තොරව අතිරේක ඉන්ධන ලීටර් 1183 ක් යොදවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ සඳහා මහා සභා අනුමැතිය ලබාගෙන ඇත. |
| (ආ) | 2015 මැයි 15 දිනැති අංක 1914/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියෝග අංක 3(1)1 | දඹුල්ල මහා නගර සභාවේ රැස්වීම් සඳහා නොපැමිණි සභිකයන් දෙදෙනෙකුට සභික දීමනා හා දුරකථන දීමනා ගෙවා තිබුණි. | අති විශේෂ ගැසට් නිවේදනය අනුව කටයුතු කළ යුතු වේ. | මෙවැනි තත්වයන් ඇතිවීම වළක්වා ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |

1.4.2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කවෂිමා ව්‍යාපෘතියේ උපදේශන කටයුතු සඳහා කොන්ත්‍රාත් මුදලින් 3% ක මුදලකට දඹුල්ල මහා නගර සභාව සමඟ එළඹ තිබුණු අවබෝධතා ගිවිසුම ප්‍රකාරව සැපයිය යුතු වෘත්තීමය උපදේශන සේවාව තහවුරු කර නොගෙන නගර සභාවේ නිලධාරීන් 06 දෙනෙක් සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 890,000 ක මුදලක් ගෙවා තිබුණි. | දීමනා ගෙවීමේ දී සපයන ලද සේවා පිළිබඳ තහවුරු අවශ්‍ය වේ. | මෙම මුදල් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය විසින් ප්‍රතිපූර්ණය කිරීමට නියමිත බව දන්වමි. |
| (ආ) | යථෝක්ත ව්‍යාපෘතියේ උපදේශන ගාස්තු යටතේ වෑන් රථයක් කුලී ගෙවීමේ පදනම මත දිවා රාත්‍රී සේවය සඳහා යොදවා ධාවනය කර ඇති බවට වන ලිඛිත සාක්ෂිවලින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.944,000 ක මුදලක් ගෙවා තිබුණි. | ධාවනය කර ඇති බවට ධාවන සටහන් සහ ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ. | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය විසින් ප්‍රතිපූර්ණය කිරීමට නියමිත බව දන්වමි. |
| (ඇ) | සිව් අවුරුදු සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා ලබාගත් උපදේශන මණ්ඩලය ඉටුකරන ලද කාර්යය සම්බන්ධයෙන් පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත්ව නොතිබියදී රු.232,000 ක මුදලක් ගෙවා තිබුණි. | සභාවේ විධායක ශ්‍රේණියේ වෘත්තීමය තනතුරු දරන නිලධාරීන් සිටියදී වෙනත් උපදේශකයින්ට ගෙවීමට මහා නගර සභා පනතේ ප්‍රතිපාදන නොතිබුණි. | මහා නගර සභාවේ කටයුතු සඳහා සිව් අවුරුදු සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා අත්දැකීම් සහිත නිලධාරීන් නොමැති වීම හේතුවෙන් මෙසේ කටයුතු කර ඇත. |
| (ඈ) | නාගරික ඉංජිනේරුවරයා සභාවේ සේවයට වාර්තා කළ දිනය 2017 අප්‍රේල් 20 වුවත් ඉංජිනේරු සේවයට අදාළව පෙරදාතම් කළ පත්වීම් දිනය වූ 2015 පෙබරවාරි 15 දින සිට සේවයට වාර්තා කළ දිනය දක්වා හිඟ වෘත්තීය හා දුරකථන දීමනා වශයෙන් රු.450,516 ක මුදලක් දඹුල්ල මහා නගර සභාව විසින් මහනුවර මහා නගර සභාවෙන් ලබාගෙන ගෙවා තිබුණි. | මෙම ගෙවීම් සුදුසු අනුමැතියක් ලබාගැනීමෙන් පසු පමණක් ගෙවීම් කළ යුතු වේ. | මේ සම්බන්ධව ඉහළ මට්ටමේ ලිපි හුවමාරු වන අතර මෙය ලබා ගත හැකි දීමනාවක් ලෙස පිළිගෙන ඇති බවට වාර්තා වී ඇත. මේ සම්බන්ධව දෙනු ලබන අවසන් නියෝගය පරිදි ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඉ) | (i) මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2018 ජූනි 28 දිනැති අංක CPC/CLG/1/5/1 දරන උපදෙස්මාලාවට අනුව ප්‍රධාන | යථෝක්ත උපදෙස් මාලාව අනුගමනය කළ යුතු වේ. | දඹුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේම පවත්වාගෙන යා යුතු අනිවාර්ය සේවාවන් සැපයීමට කාර්යමණ්ඩලය |

| | | | |
|---|---|---|---|
| | ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන මාර්ග කම්කරුවන් 22 ක් 2018 අගෝස්තු 01 දින සිට බඳවාගෙන දෙසැම්බර් දක්වා සභා අරමුදලින් රු.25,663,200 ක් වැටුප් ගෙවා තිබුණි. | | ප්‍රමාණවත් නොවීම මත අනුමැතියට යටත්ව පුරප්පාඩු සපුරා ගැනීමට කම්කරුවන් බඳවා ගෙන සේවාව ලබා ගන්නා අතර ගෙවා ඇති මුදල් මහා නගර සභා අරමුදලින් ගෙවා ඇති බවත් මේ දක්වා එම මුදල් ප්‍රතිපූරණය වීමක් වී නොමැති බවත් දන්වමි. |
| | (ii) ඉහත පරිදි ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතියකින් තොරව විවිධ පදනම් යටතේ දෛනික වැටුප් ගෙවනු ලබන සේවකයින් 65 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර නගර සභා අරමුදලින් සමාලෝචිත වර්ෂය තුළ වැටුප් ලෙස රු.13,512,639 ක් ගෙවා තිබුණි. | යථෝක්ත උපදෙස් මාලාව අනුගමනය කළ යුතු වේ. | දඹුල්ල මහා නගර සභාව බල ප්‍රදේශයේම පවත්වාගෙන යා යුතු අනිවාර්ය සේවාවන් සැපයීමට කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම මත අනුමැතියට යටත්ව පුරප්පාඩු සපුරා ගැනීමට කම්කරුවන් බඳවා ගෙන සේවාව ලබා ගන්නා අතර ගෙවා ඇති මුදල් මහා නගර සභා අරමුදලින් ගෙවා ඇති බවත් මේ දක්වා එම මුදල් ප්‍රතිපූරණය වීමක් වී නොමැති බවත් දන්වමි. |
| (ඊ) | නාගරික කොමසාරිස්වරයාගේ පැමිණීම හා නිවාඩු සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයකින් තොරව 2017 සැප්තැම්බර් සිට 2018 දෙසැම්බර් දක්වා වැටුප් වශයෙන් රු.1,247,992 ක මුදලක්ද, වැඩ බැලීමේ දීමනාව වශයෙන් රු.145,753 ක මුදලක්ද, කසළ කළමනාකරණ අධීක්ෂණ කටයුතු සඳහා නිවාඩු දින වැටුප් වශයෙන් රු.211,604 ක මුදලක්ද ගෙවා තිබුණි. | සේවයට පැමිණීම, පිටවීම හා නිවාඩු සනාථ කරගැනීම හා රාජකාරි අධීක්ෂණයට ලක් කිරීමෙන් පසු ගෙවීම් සිදු කළ යුතු වේ. | මහා නගර සභාවේ නාගරික කොමසාරිස් වරයාට නගර සීමාව තුල ග්‍රාමසේවා වසම් 13ක සෞඛ්‍ය, මංමාවත් ඇතුළු කටයුතු සිදු කිරීමේදී නිරන්තරයෙන් ක්ෂේත්‍ර කටයුතුවල යෙදීමට සිදුවීම නිසා පැමිණීම, පිටවීම අත්සන් කිරීමට හැකි නොවූ බව දන්වමි. |
| (උ) | ආයුර්වේද වෛද්‍ය නිලධාරිවරයා 2018 දෙසැම්බර් 05 දින සේවය අතහැර ගොස් ඇති නමුත් එම මාසය සඳහා වැටුප් වශයෙන් රු.52,510 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවූ වැටුප් අයකර ගත යුතු වේ. | වර්තමානය වන විට මෙම නිලධාරියා සේවයට පැමිණෙන බැවින් වැටුප් ගෙවීමේදී මෙම මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරමි. |

2 මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,358,025 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,518,978 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 52,960,000 | 35,614,890 | 31,314,807 | 6,410,944 | 14,220,000 | 12,486,524 | 8,922,494 | 6,643,525 |
| කුලී | 16,090,000 | 16,622,969 | 19,256,852 | 12,145,463 | 14,480,000 | 12,539,193 | 11,906,354 | 14,905,596 |
| බලපත්‍ර ගාස්තු | 10,700,000 | 6,991,409 | 8,393,013 | 55,885 | 8,650,000 | 5,796,117 | 6,750,440 | 1,457,490 |
| වෙනත් ආදායම් | 57,595,600 | 29,854,800 | 44,777,046 | 1,345,000 | 35,154,500 | 36,454,485 | 32,029,260 | 22,847,453 |
| එකතුව | 137,345,600 | 89,084,068 | 103,741,718 | 19,957,292 | 72,504,500 | 67,276,319 | 59,608,548 | 45,854,064 |

2.2.2 වරිපනම්

-----------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට වරිපනම් බිල් කිරීම් රු.4,012,663 ක් වූ අතර ඉන් රු.2,001,640 ක් පමණක් වර්ෂය තුළ අයකරගෙන තිබීම නිසා වර්ෂය අවසානයට හිඟය රු.6,030,947 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිවැරදි තොරතුරු ලබාගැනීමට ඇති අපහසුතාවය නිසා දිගින් දිගටම එන ශේෂයන් වන අතර මුල් අවස්ථාවේදීම හඳුනාගෙන කටයුතු නොකිරීම නිසා මෙම ගැටලුවට මුහුණ පා ඇත. |
| (ආ) | වර්ෂය ආරම්භයේ හිඟ මුදල රු.6,431,416 කින් වර්ෂය තුළ රු.2,379,623 ක් පමණක් අයකරගෙන තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ශේෂයන් සම්බන්ධයෙන් දැනුවත් කර ඇතත් එම කටයුතු නිවැරදිව සිදුවී නොමැති බව දන්වමි. |

2.2.3 බදු කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට බස් නැවතුම්පළ හා තොග පොළ කඩකාමරවලින් හිඟ කුලී වශයෙන් රු.8,575,662 ක් ලැබිය යුතුව තිබුණු අතර බස් නැවතුම්පළ කඩකාමර 26 ක් හා තොග පොළ කඩකාමර 46 ක් ප්‍රයෝජනයට නොගෙන වසාදමා තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම කඩකාමර සහා තීරණයක් මඟින් නව බදුකරුවන්ට ලබාදීමට කටයුතු කරමි. |

2.2.4 බලපත්‍ර ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කුලී ත්‍රීරෝද රථ 364 කින් 2018 වර්ෂය සඳහා ලියාපදිංචි ගාස්තු ලෙස රු.455,000 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම හිඟ කුලී ගෙවීමට ත්‍රීරෝද රථ සංගමය එකඟ වී ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සමීක්ෂණයක් සිදුකර වෙළඳ ව්‍යාපාර හඳුනාගැනීමක් සිදුකර නොතිබූ අතර 2018 වර්ෂය අවසාන වන විට ලැබිය යුතු ව්‍යාපාර බදු රු.55,885 ක් විය. | ව්‍යාපාරික ස්ථාන සමීක්ෂණයක් සිදුකර ලැබිය යුතු ව්‍යාපාර බදු නිවැරදිව හඳුනාගෙන අයකර ගත යුතු වේ. | මේ සම්බන්ධව පැහැදිලි අවබෝධයක් අදාළ නිලධාරියා වෙත නොමැති බැවින් බදු අයකරගත නොහැකි වී ඇත. |

2.2.5 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභාව සතු මාලු කඩ 12 ක හිඟ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රු.588,860 ක මුදලක් අයවිය යුතුව තිබුණි. | හිඟ ටෙන්ඩර් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කාර්යසාධනය
-----------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභාව විසින් 2018 වර්ෂය තුළ ඉටුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සහිත ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි අපේක්ෂිත මූල්‍ය කාර්යසාධනය දක්වා නොතිබුණි. | මන්ත්‍රී යෝජනා සහ සභාවේ අරමුණු අනුව අපේක්ෂිත ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර අපේක්ෂිත මූල්‍ය කාර්යසාධනයද දැක්විය යුතු වේ. | මහා නගර සභාව කටයුතු කරනු ලබන්නේ සභික යෝජනා මූලික කර ගනිමින් බවත් ක්‍රියාකාරි සැලැස්මට වඩා ඔවුන්ගේ යෝජනාවලට ප්‍රමුඛතාවය ලබාදෙන බවත් දන්වමි. |

(ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්
---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ වාර්ෂික සංවර්ධන සැලැස්ම මගින් අනුමත කරන ලද වටිනාකම රු.18,723,581 ක් වූ ව්‍යාපෘති 06 ක් සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර නොතිබුණි. | අනුමත කරන ලද සංවර්ධන ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතු වේ. | මහා නගර සභාව කටයුතු කරනු ලබන්නේ සභික යෝජනා මූලික කර ගනිමින් බවත් ක්‍රියාකාරි සැලැස්මට වඩා ඔවුන්ගේ යෝජනාවලට ප්‍රමුඛතාවය ලබාදෙන බවත් දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක
----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | නගර සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කරන බවට දක්වා ඇතත් එම ඉලක්කයන් වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්කයන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කිරීම හා ඒ අනුව කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධන ඉලක්කයන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් නොකළ බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | ක්‍රියාත්මක කරන ලද තිරසර සංවර්ධන අරමුණුවලට අනුව ඉටුකරන ලද කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රගතියක් ඉදිරිපත් කර නොතිබුණි. | ඉටු කරන ලද කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධන ඉලක්කයන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් නොකළ බව දන්වමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්තතා** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්යමණ්ඩලයේ තනතුරු 46 ක් පුරප්පාඩු වී තිබුණු අතර සනීපාරක්ෂක කම්කරු තනතුරු 30 ක අතිරික්තයක් පැවතුණි. | කාර්යමණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | අනුමත කාර්යමණ්ඩලයේ 46 ක පුරප්පාඩු පවතින බවත් කම්කරු තනතුරු අතිරික්ත ලෙස සටහන් වුවත් මාර්ග සහ සෞඛ්‍ය කම්කරු වශයෙන් බඳවා ගන්නා අය කළමනාකරණ සහකාර සේවයේ රාජකාරිවල නියුක්ත කර ඇති බවත් ආයතනය පරිපාලනය කළ යුතු බැවින් මෙවැනි ක්‍රියා මාර්ගයන්ට පෙළඹී ඇත. |
| (ආ) | **විනය කටයුතු** | | |
| | මාර්ග කම්කරුවකු 2018 දෙසැම්බර් 06 වන දින සිට සේවයෙන් පහ කර තිබූ අතර ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 8:6 උප වගන්තියට අනුව සේවකයා ලබාගත් නිවාඩු, වැටුප් රහිත නිවාඩු සේ නොසලකා වැටුපෙන් අඩු නොකර 2018 අගෝස්තු සිට නොවැම්බර් දක්වා රු.128,160 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවූ වැටුප් අයකර ගත යුතු වේ. | ඉදිරියේදී මෙවැනි ගැටලු ඇති නොවීමට අදාළ අංශ දැනුවත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | **සේවක ණය** | | |
| | දඹුල්ල මහා නගර සභාවේ සේවයේ නියුතු හා ස්ථාන මාරු වී ගිය සේවකයන් 04 දෙනෙකුගෙන් රු.168,231 ක ණය මුදලක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අය කරගෙන නොතිබුණි. | ණය ශේෂ අය කර ගත යුතු වේ. | මේ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කරමි. |

(ඈ) සේවක ඇප

--------------

| | | |
|---|---|---|
| මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 2003 අප්‍රේල් 11 දිනැති අංක සීපීසී/සීඑස්/06/06/02 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව නගර සභාවේ සේවය කරන නිලධාරින් 07 දෙනෙකු ඇප තබා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ඇප මුදල් තැන්පත් කළ යුතු වේ. | මේ සම්බන්ධව චක්‍රලේඛ අනුව ඉදිරියේදී කටයුතු කරමි. |

3.3 වත්කම් කළමනාකරණය

----------------------------

3.3.1 නිශ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිත්තවැල්ගොල්ල ප්‍රදේශයේ රු.1,000,000 ක පමණ වටිනාකමකට සායන මධ්‍යස්ථානයක් හා කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකර රු.1,000,000 ක් පමණ වටිනා කායවර්ධන උපකරණ සවිකර තිබුණද 2015 වර්ෂයේ සිට භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම් භාවිතයට ගග යුතු වේ. | ඉදිරියේදී මෙම ස්ථානය ප්‍රයොජනයට ගත හැකි වන පරිදි කටයුතු කරමි. |

3.3.2 වාහන උපයෝජනය

----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර සභාව සතු වාහන 05 ක් සහ ට්‍රැක්ටර් ට්‍රේලර් 02 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | අදායම් බලපත්‍ර ලබාගැනීම කළ යුතු වේ. | ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව නගර සභාව සතු වාහන 09 ක ඉන්ධන පරික්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කළ යුතු වේ. | ඉදිරියේදී මෙම කටයුතු නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | වෙනත් ආයතන සතු නගර සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 05 ක් පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන පවරා ගැනිම කළ යුතු වේ. | වාර්තාවේ සඳහන් කැබ් රථ 02 පළාත් පාලන අමාත්‍යංශ ලේකම් මඟින් ලියාපදිංචි කර ඇත.<br><br>65-8999/301-9054 සහ 301- |

| | | |
|---|---|---|
| | | 5434 රථ අදාළ ලියකියවිලි සහ ලියාපදිංචි පොත ලබාගැනීමෙන් පසු පවරා ගැනීමට කටයුතු කරමි. |

3.4 අවිධිමත් ගනුදෙනු

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභාව සතු මාළු වෙළඳසැල් බදු දීමේදී පළමුවර ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද වටිනාකමට වඩා අඩු වටිනාකමකට දෙවනවර ටෙන්ඩර් ඉදිරිපත් වී තිබුණු අතර පළමුවර අයදුම්කරන ලද ටෙන්ඩර්කරුවන්ට දන්වා යැවීමෙන් තොරව දෙවනවර ලැබුණු ටෙන්ඩර් වටිනාකම් පිළිගැනීම හේතුවෙන් රු.1,131,825 ක ටෙන්ඩර් බදු මුදලක් අහිමිවී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර අලාභ අවම කළ යුතුවේ. | ටෙන්ඩර් කැඳවීමේදී තිබූ මුල් කොන්දේසිවල දැඩි කොන්දේසි ඇතුළත්ව තිබුණේ නම් මෙය නිරාකරණය කරගත හැකිව තිබුණි. මේවා නැවත ටෙන්ඩර් කිරීමට උපදෙස් දී ඇත. |

3.5 ප්‍රසම්පාදනය

---------------

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම හා ඒ අනුව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දඹුල්ල නගරයේ ඇති වටරවුම අසල බුදු මැදුරක් ඉදිකිරීමට අදාළව කුට්ටිගල් 5000 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.170,000 ක් ගෙවා තිබූ නමුත් කුට්ටිගල් 3000 ක අවශ්‍යතාවයකට කුට්ටි ගල් 5000 ක් මිලදී ගැනීම නිසා වැඩිපුර ලබාගත් ගල් 2000 ක් සහා රු.102,000 ක් වැයකර තිබුණි. | ආවරණ අනුමැතියක් ලබාගැනීම කළ යුතු වේ. | මෙම වැඩිපුර ලබාගත් කුට්ටි ගල් දඹුල්ල මහ රෝහලේ අධිකරණ වෛද්‍යවරයාගේ ඉල්ලීම අනුව රෝහල් භූමියේ පාරක් සැකසීම සඳහා යොදාගත් බව දන්වමි. |

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන ඒකකය තුළ එක් නිලධාරියෙකු කටයුතු කරන අතර 2018 වර්ෂය තුළ විගණන විමසුම් නිකුත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකය විධිමත්ව පවත්වා ගැනීම කළ යුතු වේ.. | දැනට විගණන විමසුම් සහ ඊට අදාළ රාජකාරි සඳහා යොදවා ඇත්තේ අභ්‍යාසලාභී උපාධිධාරි සංවර්ධන නිලධාරිනියක් බැවින් මෙම තත්ත්වය ඇති වී ඇත. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ කළමනාකරණ කමිටු 01 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම කළ යුතු වේ.. | 2018 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පවත්වා ඇත්තේ එක් වරක් බව පිළිගනිමි. විගණන හා කළමනාකරණ කමිටු සාකච්ඡා සැලසුම් කළත් විවිධ හේතූන් මත ඒවා අවලංගු වීම නිසා එම සැලසුම් අක්‍රිය වී ඇත. |